# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (ඔක්තෝබර්-4 සතිය)

## 13 තේමාව - පොළොව හා අහස

01. දිනපතාම අහස නිරීක්ෂණය කර වගුව සම්පූර්ණ කරන්න.

| | දිවා අහස | | | රාත්‍රී අහස | |
|---|---|---|---|---|---|
| | හොඳින් ඉර පායා ඇත. | අහස් වලාකුළු සහිතයි | වැසි සහිත දිනයකි. | හඳ පායා ඇත. | තරු දැකීමට ඇත. |
| දිනය | ☼ | ☁ | 🌧 | ☾ | ★★★ |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |


ඉහත වගුවට අනුව දින 7ක් අහස නිරීක්ෂණය කර රූප මගින් හෝ වචනයෙන් හෝ තොරතුරු වාර්තා කරන්න.

- අහසේ ස්වභාවය වෙනස්වන ආකාරය ඔබට පෙනේවි.

02. ඔබේ නිවසට දේදුන්න ගේන්න කැමතිද? මේවා හොයා ගන්නකෝ.

ටිකක් ලොකු බේසමක්, මුහුණ බලන කණ්ණාඩියක්, සුදු ලොකු කඩදාසියක්

- හොඳට හිරු එළිය ඇති තැනකට මේවත් අරගෙන යන්න.
  පහත පෙනෙන පරිදි
  ජල බඳුනට කණ්ණාඩිය දමා තබන්න.
  සුදු පැහැති කඩදාසිය ඉදිරියෙන් අල්ලන්න.




- කඩදාසිය මත ඔබට දකින්න ලැබෙන්නේ මොනවාද?
- ඒ හිරු එළියේ තියෙනවා ද?
- ඒ වර්ණ ඔබේ පාට පෙට්ටියේ තියෙනවානම් සුදු කඩදාසියේ ඔබ දුටු දේ චිත්‍රයට නඟන්න.

E nanapiyasa 3 ශ්‍රේණිය පරිසරය -13 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.